# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,705 — 1966 ජූලි 22 වැනි සිකුරාදා — 1966.7.22

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 529 | ආදායම හා වියදම පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| සභාතුරු-ඇබෑර්තු .. .. .. .. | 530 | අය-වැය ලේඛන .. .. . | 537 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. . | 533 | දේපළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | 533 | මාර්ග කොමිටි දැන්වීම .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම .. | — | විවිධ දැන්වීම .. .. | 540 |


## පළාත් පාලන නිවේදන

ඇල් ඩී.—බී 41/47.

### කල්මුණෙයි සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

### 1966 සඳහා වූ කසළ ශෝධන විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129(ආ) වැනි වගන්තිය යටතේ සහ එකී 129(ආ) වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් සහ නිදහස් කිරීම් වලට යටත්ව, පිළිවෙළින් ජූනි 30, ජූලි 31, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකිවන සේ, කල්මුණෙයි නගරය තුළ පිහිටි සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ කසල ශෝධන විශේෂ වරිපනම් බද්දක් 1966 වැනි වර්ෂය සඳහා කල්මුණෙයි සුළු නගර සභාව විසින් පනවා තිබෙන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වැනි දින,
කොළඹ දීය.

7–1296—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

#### 13 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර සබරගමු කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලේකම්වසම් ගොඩ්වින් සිරිවර්ධන වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්නගම්පත්තු ගම්සභාවෙහි අංක 12 දරණ කොට්ඨාශයෙහි සභික ගමගේ පුංචිඅප්පුහාමි මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගනු ලැබීමෙන් පසු, නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්නගම්පත්තු ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයෙහි සභික ගමගේ පුංචිඅප්පුහාමි මහතා, මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

ඇල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
සබරගමු පෙදෙස.

1966.7.14 දින,
රත්නපුර පළාත් පාලන කාර්යාලයේදීය.

7–1304—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

(ඇ) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අවුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමර්ථ්‍යයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ඇ) කාර්යක්ෂමතා කඩයිම්.—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්‍ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්‍ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගත්තා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්‍ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වූවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදේසි.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත හවසින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නීත්‍ය හට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නීත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පල කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය පාලන මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් නිදහස් කළ හැකිද නැද්ද යන්න සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්‍ෂණයක් හෝ ලිඛිත පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතා ද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයක් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :
(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.
(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.
(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—
සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### ආහාර පරීක්ෂක තනතුර

පළාත් පාලන සේවයේ ආහාර පරීක්ෂක තනතුරක් සඳහා පළාත් පාලන සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉල්ලුම් පත්‍ර කැඳවයි.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 3,180—120×6, 180×8 සහ 240×5—රු. 6,540.

නීල ඇඳුම් කොමිෂමේ සපයනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—ඉල්ලුම්කරුවන්, මස් සහ වෙනත් ආහාර සඳහා රාජකීය සනීපාරක්ෂ ආයතනයේ (එංගලන්ත) සහතිකය ලබා තිබිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට 1966 අගෝස්තු මස 9 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 11 සහ 17 වැනි ශීර්ෂ වෙනුවට, පහත සඳහන් කොට ඇති ශීර්ෂ යොදාගත යුතුයි :—

11. (ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—
(i) මස් සහ වෙනත් ආහාර සඳහා රාජකීය සනීපාරක්ෂ ආයතනයේ සහතිකය ලබාගත් දිනය,
(ii) දීමනා හැර, දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය,
(iii) පළාත් පාලන ආයතනවල හෝ රජය යටතේ සේවා කාලය පිළිබඳ සටහන්, දරන ලද තනතුරු හා කාලසීමාවන්,

17. අත් හරින්න.

6. අයදුම්පතක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දින වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

7. නියමිත දිනට පසුව, රජයේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානියා වෙත ලැබී ඇති බවට සහතික කර ප්‍රමාදය පිළිගත හැකි හේතු දක්වමින්, ඒ අයදුම් පත්‍ර පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා විසින් නිර්දේශ කරනු ලැබුවහොත් මිස, සලකා බලනු නොලැබේ.

8. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් -සභාවේ සභාපති.

1966 ජූලි මස 13 දින,
තැ. පෙ. 530, කොළඹ.

7–1297—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය—පරීක්ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගන්නා ලද අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,860—120×17; 180×8—රු. 5,340 කි. එහි රු. 3,420 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම් විභාගයක් ද, රු. 4,800 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ද වේ.

3. මේ තනතුර පළාත් පාලන සේවයේ ආදී ප්‍රවේශක නිලධාරීන් උසස් කරනු ලැබීම සඳහා වෙන් කර ඇති අතර, පහත සඳහන් අයගේ අයදුම්පත් පමණක් භාර ගනු ලැබේ:—

(අ) 1951 ට පෙර සේවයට බඳවා ගන්නා ලද කොළඹ නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ඕවර්සියර්වරු.

(ආ) 1955.11.12 වැනි දිනට පෙර කර්මාන්ත අධිකාරීන් ලෙස සේවයට පත්කරන ලද පිළිගත් කාර්මික සුදුසුකම් නොලත් කර්මාන්ත අධිකාරීන්.

(ඇ) කොළඹ නගර සභාව හැර වෙනත් ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි කර්මාන්ත පරීක්ෂකවරු.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට 1966.8.9 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගතහැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසු අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූලි මස 11 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

7–1298—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවා පහළ ශ්‍රේණියේ ලඝුලේඛකයින්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1966

යථෝක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවා 1966. 4. 7 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකළ 1966. 3. 29 වැනි දින දරණ නිවේදනයට වැඩිදුරටත් ය.

මෙම විභාගය 1966 අගෝස්තු මස 31 වැනිදා සිට 1966 සැප්තැම්බර් මස 3 වැනිදා දක්වා පවත්වනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූලි මස 13 දින,
තැ. පෙ. 530, කොළඹ.

7–1229—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඕ.—බී. 20/65.

## සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ මුල්ලේරියාව සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

### නැමී තිබෙන ගස්

සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ යම් ගසක් හෝ එබඳු ගසක යම් අත්තක්, ගෙඩියක් හෝ වෙනත් යම් කොටසක් යම් ගොඩනැගිල්ලකට, තාප්පයකට හෝ කාණුවකට අලාභහානි සිදුවන හෝ සිදුවිය හැකි වන හෝ එබඳු ගොඩනැගිල්ලක පදිංචිකරුවනට හෝ යම් පොදු මාර්ගයක ගමනාගමනයෙහි යෙදෙන අයට අන්තරාදායක වන හෝ අන්තරායදායක විය හැකි තත්වයක පවත්නා කවර අවස්ථාවක වුව, සභාපති විසින් ඒ ගස පිහිටි ඉඩමේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමකින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාල සීමාවක් ඇතුලතදී, ඒ ගස හෝ අත්ත හෝ ගෙඩිය හෝ ගසේ වෙනයම් කොටස අවස්ථාවෝචිත පරිදි බැඳ ආරක්ෂා කිරීමට හෝ කපා ඉවත් කිරීමට ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කළ හැකි අතර ඒ දැන්වීම භාරදෙනු ලැබූ ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් එහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත එහි නියමයක් ඉටු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, සභාපති විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ කම්කරුවකු විසින් ඒ ඉඩමට ඇතුල්වී එකී අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ වියදමින්, ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් කළ යුතු යයි ඒ දැන්වීමෙන් නියමිත දේ ඉටු කළ හැකිය. ඒ සඳහා දරනු ලබන වියදම සභාවට අයවිය යුතු ණයක් හැටියට අයකර ගත හැකිය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ භාරදෙනු ලැබූ දැන්වීමක සඳහන් නියමයන් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඉටු කිරීම පැහැර හරින සෑම අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු රුපියල් පණහකට වැඩි නොවන දඩයක් සහිත දඬුවම් පැමිණවිය හැකි වරදකට වරදකරු විය යුතුය.

මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් මුල්ලේරියාව සුළු නගර සභාව අදහස්වේ.

7–1309—66.7:22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## කැළණිය සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥා පනත

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වෙනි සහ 156 වෙනි වගන්ති යටතේ කැළණිය උප නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 153 වෙනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වෙනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා 1965 කැළණිය සුළු නගර සභා ප්‍රසිද්ධි දැන්වීම් අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

2. මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනයට පෙර යම් ප්‍රසිද්ධි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ආරම්භ කර ඇති විට, මතු සඳහන් අතුරු ව්‍යවස්ථා එදින සිට අවුරුද්දක කාලයක් ඒ ප්‍රසිද්ධි දැන්වීමට අදල නොවිය යුතුය.

3. කිසියම් වීදියක, පාරක, ඇලක හෝ වැවක සිට පෙනෙන පරිදි ඒ සඳහා සභාපති විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැති කිසියම් ප්‍රසිද්ධි දැන්වීමක් කිසිම තැනැත්තකු විසින් ප්‍රචාරය නොකළ යුතුය. එසේ වුවද, මෙහි පහත සඳහන් කිසිම ප්‍රසිද්ධි දැන්වීමකට, එම ප්‍රසිද්ධි දැන්වීම ආලෝකමත් කරන ලද එකක් හෝ අහස් දැන්වීමක් නොවන්නේ නම්, මෙම අතුරු ව්‍යවස්ථාවේ මෙයට පෙරාතුව වූ විධිවිධාන අදළ නොවිය යුතුය :—

(අ) එකතුවන ශුද්ධ ලාභ කිසියම් පුණ්‍යාධාර කටයුත්තක් සඳහා වැය කරනු ලැබීමට නියමිත විනෝදවීමක් හා සම්බන්ධ ප්‍රසිද්ධි දැන්වීමක් ;

(ආ) ප්‍රසිද්ධි දැන්වීම තබා ඇති ස්ථානයේම පවත්වනු ලැබීමට නියමිත යම් විනෝදාංශයක් හා සම්බන්ධ ප්‍රසිද්ධි දැන්වීමක් ;

(ඇ) රජය මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රසිද්ධි දැන්වීමක් ;

(ඈ) ආගමික රැස්වීමක්, දේශපාලන රැස්වීමක් හෝ ප්‍රසිද්ධ රැස්වීමක් හා සම්බන්ධ ප්‍රසිද්ධි දැන්වීමක් ;

(ඉ) කිසියම් ගොඩනැගිල්ලක ජනේලයක ඇති ප්‍රසිද්ධි දැන්වීමක් ;

(ඊ) '' බදු දීමට තිබේ '' යන ප්‍රසිද්ධි දැන්වීමක් ;

(උ) '' විකිණීමට තිබේ '' යන ප්‍රසිද්ධි දැන්වීමක් ;

(ඌ) ගෘහ නාම තහඩුවක් ;

(එ) වර්ග ප්‍රමාණයෙන් වර්ග අඩි එකකට වැඩි නොවන්නාවූද වෘත්තීය කාර්‍ය සඳහා පාවිච්චි කරනු ලබන්නාවූ ද නාම තහඩුවක් ;

(ඒ) වෙළෙඳාම කර ගෙන යෑම සඳහා පාවිච්චි කරනු ලබන වාහනයක ඇති එම වාහනය අයිතිකරුගේ නම සහ ලිපිනය දක්වෙන ප්‍රසිද්ධි දැන්වීමක් ; සහ

(ඔ) ප්‍රසිද්ධි දැන්වීම ප්‍රදර්ශනය කොට ඇති ස්ථානයේම පවත්වා ගෙන යනු ලබන වෙළෙඳාමට හෝ ව්‍යාපාරයට සම්බන්ධ ප්‍රසිද්ධි දැන්වීමක්.

4. (1) යම් ප්‍රසිද්ධි දැන්වීමක් ප්‍රචාරය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම් පතක් ම, එම දැන්වීම ප්‍රචාරය කිරීමට අදහස් කරන දිනයට අඩු වශයෙන් සතියක් වත් කලින් සභාව මගින් සපයා ඇති ආකෘතියක මාර්ගයෙන් සභාපතිට එවිය යුතුය.

එසේ වුවද, මෙම ජේදයේ පෙරාතුව වූ විධිවිධානවල නියමිත කාල සීමාවට පසුව ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් සභාපති විසින් විශේෂ කරුණු උඩ භාරගත හැකිය.

(2) 1 වෙනි ජේදයෙහි සඳහන් සෑම අයදුම් පතක්ම, අයදුම්කරු විසින් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රසිද්ධි දැන්වීමේ පිටපතක් සමඟ එවිය යුතු අතර, එම ප්‍රසිද්ධි දැන්වීම ප්‍රදර්ශනය කිරීමට නියමිත ස්ථානය පෙන්වන සැලැස්මක් ද ඉදිරිපත් කළ යුතුය.

(3) 1 වෙනි ජේදයේ සඳහන් අයදුම් පත්‍රයක් සභාපති විසින් අනුමත කරනු ලබන අවස්ථාවකදී එම ප්‍රසිද්ධි දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා වූ අවසර පත්‍රයට, මෙහි ඇති උපලේඛනයෙහි සඳහන් ගණන් අනුව පිළියෙල කරන ලද ගාස්තුවක් ගෙවීමට සභාපති විසින් අයදුම්කරුට නියම කළ යුතුය. එවැනි ගාස්තුවක් ගෙවන තෙක් එවැනි බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

5. (1) කිසි යම් තැනැත්තකුට ප්‍රසිද්ධි දැන්වීමක් සඳහා අවසර පත්‍රයක් නිකුත් කළ විට සභාපති විසින් එම තැනැත්තාට—

(අ) ඒ ප්‍රසිද්ධි දැන්වීමේ සෑම පිටපතකම ඒ සඳහා නිකුත් කර ඇති අවසර පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන ලෙස, හෝ

(ආ) ඒ ප්‍රසිද්ධි දැන්වීමේ සෑම පිටපතක් ම, එම දැන්වීම සඳහා බල පත්‍රයට ගාස්තු ගෙවා ඇති බව සඳහන් කිරීම සඳහා මුද්‍රා තැබීමට සභාපති වෙත ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වෙනි ජේදය යටතේ සභාපති විසින් නියමයක් කරනු ලැබූ සෑම තැනැත්තකු විසින්ම ඒ නියමය ඉෂ්ට කළ යුතුය.

6. කිසිම තැනැත්තකු විසින්—

(අ) සභාවේ කර්මාන්ත පරිපාලක විසින් අනුමත කරන ලද ක්‍රමය අනුව තනන ලද හෝ ගොඩ නගන ලද ප්‍රසිද්ධි දැන්වීමක් නෙරා ගිය සංඥවක් නොවන්නේ නම්, ගොඩනැගිලි සීමාවේ සිට හරහට මැනීමෙන් පසු පාරක සිට හෝ වීදියක සිට අඟල් 6 කට වැඩි දුරක් නෙරායන සේ ඒ ප්‍රසිද්ධි දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබීමට ;

(ආ) ගොඩනැගිලි සීමාවක් නොමැති ස්ථානයක පාරේ මැද සිට අඩු වශයෙන් අඩි විසිපහක් ඈතින් නොමැති කිසි යම් ප්‍රසිද්ධ දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබීමට ;

(ඇ) යම් කිසි වීදියක් හෝ පාරක් උඩින් නෙරා යන සේ හෝ පොළවේ සිට අඩි විසිපහකට වඩා උස් වූ කිසි යම් දැන්වීම් පුවරුවක ප්‍රසිද්ධි දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබීමට ;

(ඈ) ගොඩනැගිල්ලක ඉදිරි පසින් කිසිම වීථියකට හෝ පාරකට නෙරා සිටින සේ සිටුවා හෝ එල්ලා තැබීම පිණිස කිසියම් වෙළෙඳහල් සංඥ පුවරුවක් දිගින් එවැනි ගොඩනැගිල්ලක ඉදිරිපසේ සීමාවෙන් පිටතට යනසේ, හෝ එවැනි සංඥ පුවරුවක් උඩින් යම් ස්ථානයකදී පදික වේදිකාවේ සිට හෝ පොළව මට්ටමේ සිට එම සලකුණේ යට මට්ටම දක්වා ඇති දුර ප්‍රමාණයෙන් හතරෙන් පංගුවකට වඩා වැඩි වන සේ සවිකරනු ලැබීමට හෝ එල්ලා තබනු ලැබීමට හෝ ;

(ඉ) සභාවේ කර්මාන්ත පරිපාලක විසින් අනුමත නොකරන ලද ක්‍රමයකට කිසි යම් අහස් දැන්වීමක් ගොඩනගනු ලැබීමට හෝ ඉදි කරනු ලැබීමට

කටයුතු නොසැලැස්විය යුතුය.

7. කිසිම තැනැත්තකු විසින් කිසිම ප්‍රසිද්ධ සිද්ධස්ථානයක, ප්‍රසිද්ධ උද්‍යානයක හෝ වැසිකිළියක හෝ කිසි යම් පාලමක, වීදි ලාම්පු කණුවක, විදුලි පණිවුඩ කම්බි කණුවක හෝ ටැලිපෝන් කම්බි කණුවක හෝ ප්‍රධාන විදුලි කණුවක කිසි යම් ප්‍රසිද්ධි දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබීමට කටයුතු නොසැලැස්විය යුතු ය.

8. (1) සභාපතිගේ අදහස අනුව කිසි යම් ප්‍රසිද්ධි දැන්වීමක් අශෝභන හෝ නොනිසි තතත්වයක තිබේ නම්, එම දැන්වීම ප්‍රචාරය කරවන තැනැත්තාට, එම දැන්වීම ප්‍රචාරය කිරීම එහි නියමිත කාලය ඇතුළත නතර කරන ලෙස ලිඛිත දැන්වීමක මාර්ගයෙන් සභාපති විසින් අණ කළ හැකිය.

(2) සභාපති විසින් කිසි යම් තැනැත්තකුට 1 වෙනි ජේදය යටතේ දැන්වීමක් භාර දුනහොත්, එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත දී ඒ අනුව ඔහු ක්‍රියා කළ යුතුය.

9. ප්‍රසිද්ධි දැන්වීම් සඳහා පාවිච්චි කරනු ලබන කිසි යම් දැන්වීම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්—

(අ) එම දැන්වීම් පුවරුව නිසි වේලාවට අළුත්වැඩියා කර ආරක්ෂා සහිත තත්ත්වයක පවත්වාගෙන යා යුතු ය ; තවද

(ආ) තමාගේ නම සහ ලිපිනය, පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරෙන් එම දැන්වීම් පුවරුවේ ඉදිරිපසින් ප්‍රකටව පෙනෙන ස්ථානයක පෙන්නුම් කළ යුතුය.

10. කිසි යම් ප්‍රසිද්ධි දැන්වීමක් සඳහා මුදල් ගෙවූ බව සනාථ කිරීමට සභාපති විසින් එම දැන්වීමේ තබන ලද කිසි යම් සංඥවක්, සලකුණක්, අකුරක්, වචනයක් හෝ ඉලක්කමක් මැකීම හෝ මකනු ලැබීමට සැලැස්වීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්—

(අ) සභාපති විසින් අනුමත කරන ලද ක්‍රමයේ ප්‍රසිද්ධි දැන්වීමක් හැර, වෙන ඕනෑම දැන්වීමක් කිසි යම් වාහනයක ප්‍රදර්ශනය කරනු ලැබීමට, හෝ

(ආ) පොලිස් අධිකාරී විසින් අනුමත කරන ලද ආලෝකමත් කළ ප්‍රසිද්ධි දැන්වීමක් හැර වෙන කිසිම ආලෝකමත් කළ දැන්වීමක්, කිසිම වාහනයක තබා, කිසිම පාරක හෝ වීදියක ගෙන යනු ලැබීමට

නොසැලැස්විය යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අතුරෙන් යමක් කඩකරමින් ක්‍රියා කරන ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු වාත් හැර, දිගටම පවත්වාගෙන යන කඩ කිරීමක් සම්බන්ධයෙන් වරදකරු කිරීමෙන් පසු හෝ ඒ කඩකිරීම පිළිබඳව අවධානය යොමු කරමින් සභාපතිගෙන් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු ඒ කඩකිරීම පවත්වා ගෙන යන සෑම දිනයක්ම සඳහා රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙන් විරුද්ධාර්ථයක් අවශ්‍ය නොවූ විටක—

"ප්‍රසිද්ධි දැන්වීම" යන්නට යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් උඩින් හෝ එබන්දක් මත පිහිටා ඇත්තා වූ ද, දැන්වීම් ප්‍රසිද්ධ කිරීමේ ස්වභාවයෙන් වූ හෝ ඒ සඳහා සම්පූර්ණයෙන් හෝ කොටසක් පාවිච්චි කරනු ලබන්නා වූ ද යම් නිර්මාණයක්, අකුරක්, අංකයක්, සලකුණක්, විශාල දැන්වීම් පත්‍රයක්, පුවරුවක්, දැන්වීමක්, උපක්‍රමයක්, ආදර්ශ රූපයක් හෝ නිරූපණයක් ඇතුළත් වේ ;

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ ;

"සභාව" යනුවෙන් කැළණිය උප නගර සභාව අදහස් වේ ;

"දැන්වීම් පුවරුව" යනුවෙන් ප්‍රසිද්ධි දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා තනා ඇති හෝ ප්‍රයෝජනයට ගෙන ඇති යම් නිර්මාණයක්, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, තාප්පයක්, පෙට්ටියක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වේ ; තවද

"අහස් දැන්වීම" යනුවෙන් යම් වීථියක, මාර්ගයක, ඇලක හෝ වැවක යම් තැනක සිට බැලූ විට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් අහස පසුබිම් කොට පෙනෙන පරිදි යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදිකිරීමක හෝ එබන්දකට උඩින් දක්වෙන යම් කණුවකට, රිටකට, ධජයකට, රාමුවකට හෝ වෙනත් ආධාරකයකට සවි කරන ලද්ද වූ ද ප්‍රසිද්ධි දැන්වීම් සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද යම් වචනයක්, අකුරක්, ආදර්ශයක්, සංඥවක්, උපක්‍රමයක් හෝ නිරූපණයක් අදහස් වන අතර, ප්‍රසිද්ධි දැන්වීම් සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යම් ඉඩමක, ගොඩනැගිල්ලක, ඉදිකිරීමක, වීථියක හෝ මාර්ගයක හෝ එබන්දකට උඩින් පාවිච්චි කරනු ලබන යම් බැලූනයක්, පැරෂූටයක්, වරේලරයක් හෝ එබඳු වෙනත් උපක්‍රමයක් එයට ඇතුළත් වේ.

උපලේඛනය

බලපත්‍ර සඳහා අය කරන ගාස්තු

| ප්‍රසිද්ධි දැන්වීමේ විස්තර | බලපත්‍රය සඳහා ගාස්තු | | |
|---|---|---|---|
| | මසකට හෝ ඉන් කොටසකට<br>රු. ශ. | | වර්ෂයකට<br>රු. ශ. |
| 1. කිසියම් බැම්මක හෝ තාප්පයක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමකට (චිත්‍රපට ප්‍රසිද්ධි දැන්වීම් හැර) සෑම වර්ග අඩියකටම ... | 0 10 | ... | 1 0 |
| 2. පුවරුවක හෝ ආධාරකයක තබා පුද්ගලයකු විසින් ගෙනයනු ලබන හෝ ගමන් කරන වාහනයක සවිකොට ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමකට (චිත්‍රපට ප්‍රසිද්ධි දැන්වීම් හැර) — | | | |
| (අ) එම දැන්වීම වර්ග අඩි 6 කට වැඩි නොවන විට, සෑම වර්ග අඩියකටම... | 0 25 | ... | 2 50 |
| (ආ) එම දැන්වීම වර්ග අඩි 6කට වැඩි සෑම වර්ග අඩියකටම ... | 0 50 | ... | 5 0 |
| 3. චිත්‍රපට ප්‍රසිද්ධි දැන්වීමක සෑම වර්ග අඩියකටම ... ... | 0 10 | ... | 1 0 |

7–1307—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී 54/47

## එරාවූර් සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ එරාවූර් සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.7.6 දින,
කොළඹ දී ය.

### කසල වළවල්වලින් කසල ඉවත් කිරීමට අදාල අතුරු ව්‍යවස්ථා

1. සභාව විසින් පිහිටුවා ඇති කසල ශෝධනය හා මළ බැහැරලීමේ සේවයක් සලසනු ලැබ ඇත්තාවූ ද, යම්කිසි වැසිකිළියක් සමග සම්බන්ධ කසල වළකට බාහිර වශයෙන් වූ වෙනත් කසල වළවල් එකක් හෝ ඊට වැඩි ගණනක් සපයනු ලැබ ඇත්තාවූ ද, යම්කිසි ස්ථානයක පදිංචිකරු විසින් එකී වළවල් වලින් කසල ඉවත් කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව වූ ගාස්තුවක් මාස්පතා එරාවූර් සුළු නගර සභාවට ගෙවිය යුතුය :—

(අ) යම්කිසි ව්‍යාපාරයකට අයත් කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන යම්කිසි ස්ථානයක ඇති දිගින් අඩි හතරක්, පළලින් අඩි තුනක් සහ ගැඹුරින් අඩි දෙකකින් යුත් එක් එක් කසල වල සඳහා මසකට රුපියල් තිහක ගාස්තුවක් ද,

(ආ) යම්කිසි ව්‍යාපාරයකට අයත් කාර්යයන් සඳහා පාවිච්චි නොකරනු ලබන යම්කිසි ස්ථානයක ඇති දිගින් අඩි හතරක්, පළලින් අඩි තුනක් සහ ගැඹුරින් අඩි දෙකකින් යුත් එක් එක් කසල වල සඳහා මසකට රුපියල් දෙකක ගාස්තුවක්

ද වේ.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු මෙම ගාස්තුව එකී ගාස්තුව ලැබිය යුතු මාසයට ඉක්බිති ම වූ මාසයේ දහවැනි දිනට ප්‍රථම එරාවූර් සුළු නගර සභාවේ කාර්යාලයය වෙත ගෙවිය යුතුය.

7–1294—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 වන සහ 156 වන වගන්ති යටතේ රුවන්වැල්ල සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥපනතේ අංක 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම

කබොක්, බොරළු හෝ කළු ගල් හෑරීම

දර ගබඩා කිරීම

දූව ගබඩා කිරීම

හිස් බෝතල් ගබඩා කිරීම

ගඩොල්, කබොක්ගල්, උළු හෝ කළුගල් ගබඩා කිරීම

වඩුමඩුවක් පවත්වාගෙන යාම

යන්ත්‍රානුසාරයෙන් හෝ සෙක්කුවෙන් තෙල් සිඳීම

කපාපු පොල් නිෂ්පාදනය කිරීම

කොහු තෙලීම හෝ කොහු වලින් හෝ කෙඳිවලින් බඩු සෑදීම

ස්වර්ණාභරණ සෑදීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම

කම්හලක් හෝ ආචාරි පට්ටලයක් පවත්වාගෙන යාම

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම

ධාන්‍ය වර්ග හෝ ඇට හෝ කුළු බඩු යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම

තෙල් වලින්, ඉන්ධන වලින්, වාෂ්ප බලයෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරනු ලබන යම් ව්‍යාපාරයක්

විදුලි වැඩකරන වැඩ පලක් පවත්වාගෙන යෑම

අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩකරන යම් ව්‍යාපාරයක්

බෙලෙක් වැඩ කරන වැඩ පලක් පවත්වාගෙන යෑම

ටයර් සහ ටියුබ් වොල්කනයිසින් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම

බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම

මෝටර් රථ අළුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම

ඡායාරූප ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම

සහල් මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් පවත්වාගෙන යෑම

සිසිල් බීම සෑදීම

හිස් ගෝනි ගබඩා කිරීම

ලී ඉරන මෝලක් පවත්වා ගෙන යාම

පරණ යකඩ බඩු ගබඩා කිරීම

ගඩොල් හෝ උළු සෑදීම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාරයක් වශයෙන් සැළකිය යුතුයි :—

රසකැවිලි සෑදීම

නරක්විය හැකි ආහාර තොග වශයෙන් විකිණීම සඳහා ගබඩා කිරීම

විනාකිරි සෑදීම හෝ ගබඩා කිරීම

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම

බීඩි හෝ සුරුට්ටු සෑදීම

ක්‍රේප් රබර් හෝ ෂීට් රබර් සෑදීම හෝ දුම් ගැසීම

කොහු තෙලීම හෝ ගබඩා කිරීම

පොල් ලෙලි වලක් පවත්වාගෙන යාම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුයි.

කොහු සායම් කිරීම

බැටරි පිරවීම

හුණු ගල් පිළිස්සීම, ගබඩා කිරීම, වියලා සකස් කිරීම හෝ කැබලි වලට කැඩීම.

7–1305—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී 72/49

## මතුගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 හා 156 වැනි වගන්ති යටතේ මතුගම සුළු නගර සභාව විසින් පනවනු ලැබ එකී ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූනි මස 23 වැනි දින,
කොළඹ දීය.

---

## අතුරු ව්‍යවස්ථා

වැසිකිළි ශෝධන ගාස්තු පැනවීමට අදාලව 1949 ඔක්තෝබර් මස 14 දින අංක 10,031 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කොට, 1963 පෙබරවාරි මස 1 වැනි දින අංක 13,498 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අවසන් වරට සංශෝධිත අතුරු ව්‍යවස්ථා තවදුරටත් මෙසේ සංශෝධනය කරනු ලැබේ :—

(1)1(අ) දරන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් "රුපියල් දෙක" යන වචන වෙනුවට "රුපියල් පහ" යන වචන ආදේශ කිරීමෙන්, හා

(2) 1 (ආ) දරන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් "ශත පණහ" යන වචන වෙනුවට "රුපියල් එක" යන වචන ආදේශ කිරීමෙන්.

7–1306—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 15/62

## මතුගම සුළු නගර සභාව

### සුසාන භූමි හා භූමිදාන කිරීම පිළිබඳ ආඥපනත

කළුතර දිස්ත්‍රික්කයේ මතුගම සුළු නගර සභා පාලන සීමාව තුළ පිහිටි භූමිදාන කරන ස්ථාන සඳහා (231 වැනි අධිකාරය වන) සුසාන භූමි හා භූමිදාන කිරීම් පිළිබඳ ආඥපනතේ 38 වැනි වගන්තිය යටතේ මතුගම සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඉහතකී ආඥපනතේ 39 වැනි වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර ඔහු විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූනි මස 23 වැනි දින.
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. (1) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන දිනයේදී සුළු නගර සභාවේ පාලන සීමාව ඇතුළත පිහිටි සෑම සුසාන භූමියකම අයිතිකාරයා විසින් එම දිනයේ සිට මාස දෙකක් ඇතුළත එකී සුසාන භූමිය ලියාපදිංචිකිරීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසුව සුළු නගර සභාවේ පාලන සීමාව ඇතුළත යම් දිනයක පිහිටුවීමට අදහස් කරන සෑම සුසාන භූමියකම අයිතිකාරයා විසින් එකී දිනයට යටත් පිරිසෙයින් මාස තුනකටවත් මත්තෙන් එකී සුසාන භූමිය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

2. (1) සුසාන භූමියක් ලියාපදිංචි කිරීම සඳහාවූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලියවිල්ලකින්• විය යුතු අතර එය අයිතිකාරයා විසින් අත්සන් කොට සභාපතිගේ ලිපිනයට යැවිය යුතුය.

(2) මිනුම්පති විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ නිසි බලය ලත් මිනින්දෝරුවකු විසින් හෝ සහතික කරන ලද සුසාන භූමියේ සැලැස්මක් අයිතිකාරයා විසින් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

(3) අයිතිකාරයා විසින් සුසාන භූමිය භාරකාරයා වශයෙන් කෙනකු පත් කිරීමට අදහස් කරන කල්හි ඒ භාරකාරයාගේ නම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

(4) භාරකාරයා වශයෙන් ඉල්ලුම් පත්‍රයේ නම සඳහන් කළ තැනැත්තා විසින් එකී නිලය තමාට ලැබුණ බවටත් භාරකාරයා සතු කාර්යයන් තමා පිළිගත් බවටත් එකී ඉල්ලුම් පත්‍රයේ අත්සන් කළ යුතුය.

3. 2(4) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට භාරකාරයාගේ නම ඉල්ලුම් පත්‍රයේ සඳහන් නොවූ විට හෝ එසේ නම් කරනු ලැබූ භාරකාරයා ඉල්ලුම් පත්‍රයේ අත්සන් නොකරනු ලැබූ විට සුසානභූමි ලියාපදිංචි කිරීමේදී අයිතිකාරයා එකී සුසාන භූමිය භාරකාරයා වශයෙන් සලකනු ලැබේ.

4. සුසාන භූමිය භාරකාරයාගේ අභාවයේදී හෝ ඔහුගේ ඉල්ලා අස්වීමේදී ඒ වෙනුවට වෙනත් යම් භාරකාරයකුගේ නම ලියාපදිංචි කළ යුතු අතර, එසේ අළුතෙන් ලියාපදිංචි කිරීමක් කරනතුරු සභාපතිගේ අවසරය පිට මිස නැත්නම් එබඳු සුසාන භූමියක මෘත ශරීර ආදාහන කිරීම හෝ භූමිදාන කිරීම නොකළ යුතුය.

5. (1) සුසානභූමියක් භාරකාරයා විසින් එකී සුසාන භූමියේ කෙරෙන සෑම භූමිදානයක්ම හෝ ආදාහනයක්ම පිළිබඳවූ විස්තර ලේඛන ගත කළ යුතු අතර එකී භූමිදානයෙන් හෝ ආදාහනයෙන් මාසයක් ඇතුළතදී එකී ඇතුළත් කරන ලද සටහනේ උධෘතයක් සභාපති වෙත යැවිය යුතුය.

(2) මේ ලේඛනය සභාපති විසින් අනුමත කරනලද ආකාරයේ එකක් විය යුතුය.

6. සුසානභූමිය භාරකාරයා විසින් යම් වේලාවක—

(අ) සුසාන භූමිය සෝදිසි කර බැලීම හෝ

(ආ) 5(2) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලේඛනය පරීක්ෂා කර බැලීම පිණිස සභාපතිට හෝ සභාපති විසින් ඒ සඳහා බලය පවරන ලද යම් කෙනකුට හෝ යම් නිලධාරියකුට

අවසරය දිය යුතුය.

7. ලියාපදිංචි කරනලද සුසාන භූමියක අයිතිකාරයා විසින් සභාපති සෑහීමට පත්වන පරිද්දෙන් එකී සුසානභූමිය වටේ තාප්පයක් හෝ වැටක් බැඳිය යුතු අතර එකී තාප්පය හෝ වැට යහපත් තත්ත්වයකින් නඩත්තු කරගෙන යා යුතුය.

8. සුසාන භූමියක අයිතිකාරයා විසින් සභාපති සෑහීමට පත්වන පරිද්දෙන් එය වල් බිහිවීමෙන් තොරව පිරිසිදුවත් සනීපාරක්ෂා තත්ත්වයකත් තබා ගත යුතුය.

9. සෑම මිනී වලක්ම ගැඹුරින් අඩි හතර හමාරකට වඩා අඩු නොවිය යුතු අතර එය වෙනත් යම් මිනී වලක සිට දුරින් අඩි 3කට වඩා අඩු නොවිය යුතුය.

10. නියම බලධරයකුගේ නියමය පිට මිස කිසිවකු විසින් මිනී වලක යම් මෘත ශරීරයක් වළලා අවුරුද්දක් ඇතුළත එය වළලන ලද වළ නැවත විවෘත නොකළ යුතුය.

11. (1) කිසිවෙකු විසින් සුසාන භූමියේ භාරකාරයාගේ අවසරය නැතිව සුසාන භූමියක මෘත ශරීරයක් භූමිදාන කිරීම හෝ ආදාහන කිරීම නොකළ යුතුය.

(2) සුසාන භූමියේ භාරකාරයා විසින් ඒ සුසාන භූමියේ නියම් කරනලද යම් ස්ථානයකට බාහිරවූ වෙනත් ස්ථානයක කිසිවකු විසින් මෘත ශරීරයක් අදාහනය කිරීම නොකළ යුතුය.

12. සුසාන භූමියක ආදාහනයක් කිරීම පිළිබඳව වගකිවයුතු තැනැත්තා විසින් එකී ආදාහනයෙන් දින තුනක් ඇතුළත ආදාහන යෙන් පසුව ඉතිරිවූ අළු හෝ වෙනත් කැළි කසළ වැළලීම හෝ වැළලීමට සැලැස්වීම කළ යුතුය.

13. සභාපති විසින් හෝ සභාපති විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් යම් සුසාන භූමියක් පරීක්‍ෂා කිරීම නීත්‍යානුකූල විය යුතුය.

14. සුසාන භූමියක භාරකාරයා විසින් කරන ලද නියමයකින් හෝ යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් පීඩාවට පත්වූ කිසිවකු විසින් සභාපතිට පැමිණිලි කළ හැකිය. සභාපති විසින් ඒ එක් එක් කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය නියමයන් කළ හැකිය.

15. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සුළු නගර සභාවේ සභාපති අදහස් කරනු ලැබේ.

"අයිතිකාරයා" යනුවෙන් භාරකාරයා, කළමනාකාරයා, අයිතිකාරයා හෝ සුසාන භූමියක අයිතිය හිමිවූ වෙනත් තැනැත්තා අදහස් කරනු ලැබේ.

"සුළු නගර සභාව" යනුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ මතුගම සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

7-1295—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

එල්. ඕ.—බී. 112/45.
ප. පා. දෙ.—ජීඕ. 9/44.

## ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ අච්චුවේලි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ, ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාව යි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූනි මස 12 වන දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

අච්චුවේලි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ 1957 ඔක්තෝබර් 18 වන දින අංක 11,183 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථා, එහි "වෙළඳ පොළවල් හා පොළවල්" යන ශීර්ෂය යටතේ 4 වන අතුරු ව්‍යවස්ථාවෙහි (2) ඡේදයේ "යම් ග්‍රාමීය වෙළෙඳ පොළක හෝ පොළක" යන වචනවල සිට ඒ ඡේදයේ අග දක්වා වූ සියලු ම වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"යම් ග්‍රාමීය වෙළඳ පොළක හෝ පොළක යම් කඩ පිලක්, කඩ බක්කියක් හෝ බිම් ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ ප්‍රයෝජනය ගැනීම සඳහා පහත සඳහන් ප්‍රමාණ අනු ව ගාස්තුවක් අය කළ යුතු අතර එය ගෙවිය යුතු ය:—

| එළවළු වෙළඳ පොළ | දිනකට රු. ශ. |
|---|---|
| වෙළෙඳ පොළ ගොඩනැගිල්ලෙහි වර්ග යාර දහයකට වැඩි නො වන වෙළෙඳ පිළක් සඳහා ... ... | 0 25 |
| වෙළෙඳ පොළ භූමිය ඇතුළත විවෘත බිමෙහි එක් එක් වර්ග යාරයක බිම් ප්‍රමාණය සඳහා ... ... | 0 10 |
| **මාළු වෙළඳ පොළ** | |
| වෙළෙඳ පොළ ගොඩනැගිල්ලෙහි වර්ග යාර එකකට වැඩි නො වන වෙළෙඳ පිළක් සඳහා ... ... | 0 25 |
| වෙළෙඳ පොළ භූමිය ඇතුළත විවෘත බිමෙහි එක් එක් වර්ග යාරයක බිම් ප්‍රමාණය සඳහා ... ... | 0 15" |

7-1368—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## පස්සර සුළු නගර සභාව

### 1966 දෙවන පරිපූරක වැය ලේඛනය

### පළමුවන කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|
| ඒ. 2 (ඇෆ්) ලිපි ද්‍රව්‍ය සහ තැපැල් මුද්දර පොත්පත් යනාදිය සඳහා ... ... ... | 750 0 |
| ඒ. 2 (ජේ) හදිසි වියදම් ... ... | 500 0 |
| ඒ. 2 (ඒ) අතිරේක දීමනා ... ... | 500 0 |
| ඞී. 2 (බී) කරත්ත ගොනුන් සහ ලොරි ... | 250 0 |
| ඞී. 5 (සී) ජල සම්පාදනය හා නඩත්තුව ... | 500 0 |
| ජේ. 1 පුස්තකාලයාධිපති වැටුප් ... ... | 150 0 |
| ජේ. 3 පුවත්පත් හා සඟරා ... ... | 350 0 |
| ජේ. 5 නඩත්තුව ... ... ... | 50 0 |

### දෙවන කොටස—විදුලි අංශය

| වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|
| ඊ.ඕ. 4(සී) මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය ... ... | 250 00 |
| ඊ.ඕ. 4(ඞී) විවිධ ... ... ... | 500 00 |

1966 ජූනි මස 29 වෙනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 12 දරණ කාරණය යටතේ සභා සම්මත කර ගන්නා ලදී.

ඊ. පී. ඇඩ්මන්,
සභාපති,
සුළු නගර සභාව, පස්සර.

1966 ජූලි 3 වෙනි දින,
පස්සර සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

7-1318—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## නාත්තන්ඩිය සුළු නගර සභාව

**1966 වර්ෂයේ දෙවැනි පරිපූරක අය වැය ලේඛනය**

1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | | | මුදල රු. ශ. |
|---|---|---|---|
| ඒ 1(ඊ) | කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ගාස්තු | ... | 400 0 |
| සී 4 | නඩත්තු කිරීම ... ... | ... | 1,200 0 |
| | | එකතුව ... | 1,600 0 |

2 වැනි කොටස—විදුලි අංශය

| | | | |
|---|---|---|---|
| 4(ඩී) | නානා ප්‍රකාර වියදම් ... | ... | 200 0 |
| | | එකතුව ... | 200 0 |

1966.6.24 දින පැවැත්වූ සභා රැස්වීමේදී අංක 13 දරණ යෝජනාවෙන් සභා සම්මතවිය.

ඒ. ඇම්. තාහිර්,
සභාපති.

1966 ජූලි 4 දින,
නාත්තන්ඩිය සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරන ලදි.

කේ. පී. ඊ. පියතිලක,
සහකාර පළාත් පාලන කොමසාරිස්, (ව.කො.).

1966 ජූලි 11 වන දින,
කුරුණෑගලදී.

7–1300—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## මොනරාගල සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය**

අයවැය ලේඛණය—1966

1966.6.22 වැනි දින පැවැත්වූ සුළු නගර සභා රැස්වීමේදී, පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමැතියට යටත්ව සම්මත කරගන්නා ලද පහත සඳහන් වැඩිපුර වැය ශීර්ෂයන් පිරවීම සඳහා වෙනත් ඉතිරි වැය ශීර්ෂයෝ.

| ඉතිරිය | රු. ශ. | වැඩිපුර | රු. ශ. |
|---|---|---|---|
| ඩී.—5(එච්) පොදු නාන ස්ථාන ... ... | 2,880 0 | Mඩී.—(ඩී) ඉදිකිරීම් ... ... ... | 2,880 0 |
| | 2,880 0 | | 2,880 0 |

ආර්. ජේ. ලෙනෝරා,
සභාපති,
සුළු නගර සභාව, මොනරාගල.

1966 ජූනි මස 28 වැනිද,
මොනරාගල සුළු නගරසභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

ඇම්. බී. සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1966 ජූලි මස 13 දින,
පළාත් පාලන කාර්යාලය,
බදුල්ල.

7–1302—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## රඹුක්කන සුළු නගර සභාව

**පළමුවන පරිපූරක අය වැය ලේඛනය—1966**

| වැය ශීර්ෂය | | | මුදල රු. ශ. |
|---|---|---|---|
| ඒ. (4) | ... | ... | 250 0 |
| ඒ. (4) | ... | ... | 50 0 |
| ඩී. 1 (ජී) | ... | ... | 80 0 |
| සී. 4 | ... | ... | 115 0 |
| ඒ. 2 (කේ) | ... | ... | 2,700 0 |
| ඒ. (3) | ... | ... | 150 0 |
| ජේ. (5) | ... | ... | 275 0 |
| ඊඩී. 2 (ඩී) | ... | ... | 500 0 |

1966.1.7 අංක 1, 1966.2.26 අංක 8, 1966.5.27 අංක 8 සහ 1966.6.26 අංක 23 යන යෝජනාවලින් සභාසම්මත කරගත් නාලදි.

එච්. සිලී කීර්තිරත්න,
සභාපතිනිය,
සුළුනගර සභාව, රඹුක්කන.

1966 ජූලි මස 11 වැනි දින,
රඹුක්කන සුළුනගර සභා කාර්යාලයයේදීය.

7–1317—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## වැලිගම නගර සභාව

**අතිරේක අය වැය ලේඛන අංක 1—1966**

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය |
|---|---|---|
| ඒ. 2(ඊ) නීති ගාස්තු පිළිබඳ වියදම් ... | 600 0... | 1966.7.5 අංක 6 |
| (එල්) අතිකාල දීමනා ... | 600 0... | 1966.7.5 අංක 6 |
| ජේ. 2(ඊ) වැඩිදියුණු කිරීම් ... | 6,386 80... | 1966.5.12 අංක 10 (6) |
| | 7,586 80 | |

ඇම්. පී. ලීලාරත්න,
වැලිගම නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
වැලිගම,
12.7.1966.

7–1311—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## බලපිටිය උප නගර සභාව

### පළමුවැනි අතිරේක අය වැය ලේඛනය—1966

### පළමුවෙනි කොටස (සාමාන්‍ය)

| වැය සිරස | | ගණන් බලන ලද වියදම් |
|---|---|---|
| | | රු. ශ. |
| සී. 1 | කුලී | 362 80 |
| 8 | ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | 305 0 |
| ඩී. 2 (ඒ) | කුලී | 1,000 0 |
| (බී) | ගොන්කරත්ත හා ලොරි | 300 0 |
| (සී) | ගබඩා | 5 05 |
| 3 (ඒ) | කුලී | 225 0 |
| (සී) | ගබඩා | 105 0 |
| (එච්) | ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | 100 0 |
| 6 (ඒ) | කුලී | 250 0 |
| (බී) | නඩත්තු | 1,500 0 |
| ජේ. 1 | වැටුප් | 150 0 |
| | එකතුව | 4,302 85 |

### දෙවෙනි කොටස (විදුලි)

| | | රු. ශ. |
|---|---|---|
| විදුලි 6 | දීර්ඝ කිරීම හා සංවර්ධන | 1,250 0 |

වර්ෂ 1966 ක් වූ ජුලි මස 5 වෙනි දින පැවැත්වූ මාසික සභා රැස්වීමේදී පිළිගනිමින් සම්මත කරන ලදි. (යෝජනා අංක 7)

ජී. එච්. සිල්වා,
සභාපති.
බලපිටිය උප නගර සභාව,

1966ක්වූ ජුලි මස 6 වෙනිදින,
බලපිටිය උප නගර සභා කාර්‍යාලයේදිය.

7-1313/1—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## බලපිටිය උප නගර සභාව

### 1966 අය වැය ලේඛනය

### මුදල් නියෝග 40 (II) යටතේ කෙරෙන අයදුම් පත

1966 අය වැය ලේඛනයේ ඒ ඒ වැය සිරස් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතුරු වේයයි ගණන් බලන ලද පහත පෙනෙන වැය සිරස් යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය සිරස්වලට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදීමට 1966 ජුලි මස 5 වෙනි දින පවත්වන්නට යෙදුන මාසික සභා රැස්වීමේදී අංක 7 දරන සම්මුතිමෙන් සභා සම්මතවිය.

**මුදල් ඉතුරු වැය සිරස්**

| ඩී.—මහජන සෞඛ්‍යය | රු. ශ. |
|---|---|
| 1 සාමාන්‍ය— | |
| (එච්) කානු ඉදිකිරීම | 329 14 |
| 3 (ජී) ඉදිකිරීම | 3,000 0 |
| එකතුව | 3,329 14 |

**මුදල් අවශ්‍ය වැය සිරස්**

| ඒ.—සාමාන්‍ය | රු. ශ |
|---|---|
| 1 (සී) ආදායම් පරීක්ෂක | 41 0 |
| (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | 125 0 |
| 2 (එච්) ගණන් පරීක්ෂක ගාස්තු | 388 14 |
| **බී.—මංමාවත්** | |
| 1 (බී) ඕවර්සියර් | 275 0 |
| 2 නඩත්තු | 2,500 0 |
| එකතුව | 3,329 14 |

### දෙවෙනි කොටස විදුලි

| විදුලි: | රු. ශ. |
|---|---|
| 4 (සී) මුද්‍රණ | 500 0 |
| (ඩී) සුළු වැය | 1,000 0 |
| එකතුව | 1,500 0 |

| විදුලි: | රු. ශ. |
|---|---|
| 2 (සී) මාපන යතුරු හා වෙනත් උපකරන | 500 0 |
| 4 (බී) වැටුප් හා දීමනා (බාහිර) | 250 0 |
| 6 දීර්ඝ කිරීම හා සංවර්ධන | 750 0 |
| එකතුව | 1,500 0 |

1966 ජුලි 6 වන දින,
උප නගර සභා කාර්යාලය, බලපිටිය.

ජී. එච්. සිල්වා,
සභාපති,
බලපිටිය උප නගර සභාව.

7-1313/2—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## බම්බලපිටියේ මැක්ලියොඩ් පාර කැනීම

1961 පෙබරවාරි මස 24 වන දින අංක 12,298 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ වූ 60.11.2 දින දරණ දැන්වීම් ප්‍රකාර කොළඹ නාගරික සභාව විසින් එහි සඳහන් වූ වැඩ නිමකර එම වැඩ සඳහා වියදම කොටස් කිරීම පහත දක්වෙන පරිදි බව ගෘහ සහ නගර සංවර්ධන ආඥාපනතේ 26 (6) වැනි ඡේදයේ (ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වැනි පරිච්ඡේදය) යටතේ මෙයින් දැනුම් දෙමි.

| තක්සේරු අංකය | වීථියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | වියදම් කොටස් කිරීම රු. ශ. |
|---|---|---|---|
| 15 | මැක්ලියොඩ් පාර | ඇග්නස් ලෝරන්ස් පුල්ලේ මහත්මිය, 15, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 4,045 48 |
| 17 | එම | රිනී එස්ලින් මුතුක්‍රිෂ්ණා මහත්මිය සහ දේවගැති ක්‍රිස්ටෝපර් විල්මට් මුතුක්‍රිෂ්ණා, ශාන්ත ආනා සාන්තු නිවාසය, වෝඩ් පෙදෙස, කොළඹ 7 | 2,067 69 |
| 19 | එම | ඇස්. තොම්මන්පිල්ලෙයි මහතා, 19, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 4,360 13 |
| 23 | එම | එච්. මොලගොඩ මහතා, 23, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 4,135 38 |
| 31 | එම | බී. සිවරත්නම් මහතා, 25/1, ඇලෙක්සැන්ඩ්‍රා පාර, කොළඹ 6 | 2,427 29 |
| 33 | එම | සරස්වතී ඥානප්‍රකාශම් මහත්මිය, 15, රාජසිංහ පාර, කොළඹ 6 | 2,786 89 |
| 37 | එම | ඩී. වී. ජේ. ජයමහ මහතා, 37, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 2,607 09 |
| 39 | එම | සී. එම්. ප්‍රනාන්දු මහතා, ඇස්. දෙන් බර්නාඩ් මහතා බාරේ, "ලේඩිස්මිත්", එළිබැන්ක් පාර, කොළඹ 5 | 2,652 04 |
| 43 | එම | සිති පයිසා මාර්සූක් මහත්මිය, 22, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5 | 2,854 31 |
| 22 | ලෙයාඩ්ස් පාර, බම්බලපිටිය | ඒ. ඇම්. ඇම්. මාර්සූක් මහතා, 22, ලෙයාඩ්ස් පාර, කොළඹ 5 | 3,236 38 |
| 30 | එම | ෆ්‍රෙඩ්රික් එරල්ලූස්, 30, ලෙයාඩ්ස් පාර, කොළඹ 5 | 1,865 41 |
| 36 | මැක්ලියොඩ් පාර | ඩබ්ලිව්. පතිරණ මහතා රෙසිඩන්සි, කළුතර | 3,461 13 |
| 34 | එම | ඩී. වී. ජේ. ජයමහ, 37, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 3,595 98 |
| 32 | එම | මොරීන් ෆ්‍රෙන්සිස් ද සිල්වා මෙනවිය, 32, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 4,719 73 |
| 30 | එම | ඉන්ද්‍රානි විජේතුංග මහත්මිය, 15, වෙල්සි ගාඩන්ස්, කොළඹ 3 | 2,876 79 |
| 28 | එම | කේ. සිවප්‍රගාසම් මහත්මිය, 11, මිලාගිරිය මාවත, කොළඹ 5 | 4,135 38 |
| 26 | එම | වෙල්ලප්පා ත්‍යාගලින්ගම් මහතා, "තිරුම්එලියාර්", මිලාගිරිය මාවත, කොළඹ 5 | 4,135 38 |
| 24 | එම | මීරා සයිබෝ සිති හනිපා සහ මීරා සයිබෝ සිති සැනොඩියා, 2, එඩින්බරෝ ග්‍රෝව්, කොළඹ 7 | 2,696 99 |
| 22 | එම | පොන්නදුරෙයි බ්‍රූඩ් මහතා, 22, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 2,696 99 |
| 20 | එම | ඒ. සී. ඩයස් බණ්ඩාරනායක මහතා, 20, මැක්ලියොඩ් පාර, කොළඹ 5 | 2,696 99 |
| | | | 64,053 45 |

බ. ඕ. ජයසිංහ,
නාගරික කොමසාරිස්තැන.

නගර ශාලාව,
කොළඹ 7,
1966 ජූනි මස 30 වැනි දින.

7-1310—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## කන්තලේ සුලු නගර සභාව

### 1966 වර්ෂය සඳහා දේපල බද්ද

### සුලු නගර සභා අඥපනත (256 වැනි අධිකාරය)

සුලු නගර සභා ආඥපනතේ (256 වැනි අධිකාරය) යටතේ ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට කන්තලේ සුලු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. (159) 2 වෙනි වගන්තිය ප්‍රකාර මෙම සුලු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු මස 31 වැනිදායින් ජූනි මස 30 වැනිදායින් සැප්තැම්බර් මස 30 වැනිදායින් හා දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

එච්. බී. ඇල්. ලීලාරත්න,
සභාපති,
කන්තලේ සුලු නගර සභාව.

1966 මාර්තු මස 8 වෙනි දින,
කන්තලේ සුලු නගර සභා කාර්යාලයේ දී ය.

7-1301/22—66.7.8 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## කන්තලේ සුලු නගර සභාව

### 1966 වැනි වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### සුලු නගර සභා ආඥපනත (256 වැනි අධිකාරය)

කන්තලේ සුලු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

සුලු නගර සභා ආඥපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1966 වැනි වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමටද,

එකී ආඥපනතේ අංක 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු මස 31 වැනි දිනට හෝ ඉන් ප්‍රථම ගෙවිය හැකි අයුරින් ද වේ.

එච්. බී. ඇල්. ලීලාරත්න,
සභාපති.

1965 නොවැම්බර් මස 22 වෙනි දින,
කන්තලේ සුලු නගර සභා කාර්යාලයේ දීය.

### උප ලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රොදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා | 5.00 |
| හැම පාපැදියක්, රොදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් | 2.00 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් | 1.00 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | 3.00 |
| තනිගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා | 2.00 |
| සෑම අත්කරත්තයක් සඳහා | 2.00 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට | 1.00 |

7-1301/2—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## 261 වැනි අධිකාරිය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු අදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව මැදසියපත්තුව ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරණු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව මැදසියපත්තුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරිය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. පී. සයිමන්,
සභාපති,
හා. ප. මැදසියපත්තුව ගම්සභාව.

ගම්සභා කායාලය,
අරඹේකඩේ, කුඹුරේගම,
1966 මාර්තු 11 වෙනි දින දීය.

7-1331—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ පල්ලේ පලාත ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට තුම්පනේ පල්ලේ පලාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන පරිච්ඡේදය) 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ර්. බ. සේනානායක,
ගම්සභාපතිතැන,
තුම්පනේ පල්ලේ පලාත ගම්සභාව.

1966 මාර්තු මස 4 වැනි දින,
තුම්පනේ පල්ලේ පලාත ගම්සභා කාර්යාලයේදීය.
හතරලියද්ද.

7–1326—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

## අටකලන් කෝරළයේ මැදපත්තු ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛණයෙහි දක්වෙන අය විසින් 1966 වර්ෂයට මස් පිණිස සතුන් මැරීම හා මස් කඩ පවත්වාගෙන යෑමට බල පත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන අටකලන් කෝරළයේ මැදපත්තු ගම් සභා සීමාවතුල පදිංචි යම්කෙනෙක් විරුද්ධවන්නේනම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ගැසට් පත්‍රයෙ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥපණතේ 272 වැනි පරිච්ඡේදය 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ආතර් ඇස්. විජයරත්න,
සභාපති,
අටකළන් කෝරළයේ මැදපත්තු ගම්සභාව.

1966 ජූලි මස 7 වැනි දින,
අටකළන් කෝරළයේ මැදපත්තු ගම්සභා
කායාීලයේදීය, අටකළන්පන්න.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඇස්. අයි. ඇම්. සිද්දික් | හරක් මස් | ගොඩකවෙල ප්‍රසිද්ධ වෙළඳපොල |
| ඇස්. අයි. ඇම්. සිද්දික් | එළු මස් | ගොඩකවෙල ප්‍රසිද්ධ වෙළඳපොල |
| ඇස්. අයි. ඇම්. සිද්දික් | හරක් මස් | ඔරේන්ජ්පිල්ඩ් වත්ත, රක්වාන |
| ඒ. ඇල්. අබ්දුල් හමීඩ් | හරක් මස් | ඔරේන්ජ්පිල්ඩ් වත්ත, දකුණ, රක්වාන |

7–1324—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

---

ප.පා.දෙ.—ජී.ඒ. 19/10

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතෙ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පට්පිපොල කෝරලයේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 ජූනි මස 21 දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරණ ලද්දවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරණලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසැට් පත්‍රයේ නිවේදනයෙන් ප්‍රකාශකරණ ලද්දවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 38 දරණ කාණ්ඩය මේ යෝජනාව ගැසැට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැණීමට පට්පිපොල කෝරළයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ."

චන්ද්‍රදාස රත්නායක,
සභාපති තැන.

1966 ක්වූ ජූලි මස 7 වැනි දින,
පට්පිපොල කෝරළයේ ගම්සභා කායාීලයේදීය,
ලුනුගල.

7–1325—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## බෙන්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි අධිකාරිය) අංක 161 සහ 163 දරණ වගන්ති යටතේ බෙන්තොට සුළු නගර සභාව විසින් පහත සඳහන් උපලේඛනයෙන් විස්තර වන බලපත්‍ර ගාස්තු මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට, මෙතෙක් පනවා තිබූ බලපත්‍ර ගාස්තු වෙනුවට පනවනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1966 ජූලි 7 වැනි දින,
සුළුනගර සභා කායර්‍යාලය,
බෙන්තොට.

#### උපලේඛනය

| බලපත්‍රයේ විස්තර | වාර්ෂික බලපත්‍ර ගාස්තු රු. ශ. |
|---|---|
| ලී මඩුවක් පවත්වා ගෙන යාම ... | 10 0 |
| හුණු පෝරණුවක් පවත්වාගෙන යාම ... | 25 0 |

7-1315—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## වැලිමඩ සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි සඳහන් කොට ඇති ස්ථානයෙහි 1966 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යැමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව ගෝ ඝාතක ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබෙ.

එකීබලපත්‍රය නිකුත් කිරිම ගැන වැලිමඩ සුළු නගර සභා සීමාවතුල යම කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ එසේ විරුද්ධ වන්නේ අසවල් කරුනු මතයයි දක්වෙන ලිය විල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දිනසිට දින 14ක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කේ. එච්. ජේම්ස් සිල්වා,
සභාපති,
වැලිමඩ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
වැලිමඩ, 1966.7.6

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| 1. ඇම්. පී. ඒ. අසීස් | ප්‍රසිද්ධ වෙළඳපොලේ අංක 4 දරණ කඩය—වැලිමඩ | හරක් මස් වෙළඳාම |

7-1303—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## රක්වාන සුළු නගර සභාව

### ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත සඳහන් උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් කොට ඇති ස්ථානවල 1966 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යැමට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන රක්වාන සුළු නගර සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේනම්, එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුළතදී මා වෙත ඉදිරිපත් කළයුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ඇල්. අබ්දුල් හමීඩ්, 182, කෙළින් වීදිය, රක්වාන ... | හරක් මස්, එළුමස්, බැටළුමස්, ඌරු මස් සහ කැස්බෑ මස් | රක්වාන වෙළඳ පොලෙහි අංක 1 කඩ කාමරය |
| 2. ඒ. ඇල්. අබ්දුල් හමීඩ්, 182, කෙළින් වීදිය, රක්වාන ... | හරක් මස්, එළුමස්, බැටළුමස්, ඌරු මස් සහ කැස්බෑ මස් | රක්වාන වෙළඳ පොලෙහි අංක 1 මස් කඩය |
| 3. ඒ. ඇල්. අබ්දුල් කපාර්, 184, කෙළින් වීදිය, රක්වාන ... | එළු මස් ... | රක්වාන වෙළඳ පොලෙහි අංක 7 කඩ කාමරය |
| 4. ඒ. ඇල්. අබ්දුල් කපාර්, 184, කෙළින් වීදිය, රක්වාන ... | හරක් මස් ... | රක්වාන වෙළඳ පොලෙහි අංක 2 මස් කඩය |

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1966 ජූලි මස 7 වෙනි දින,
රක්වාන සුළු නගර සභා කායර්‍යාලයේදීය.

7-1327—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## ජල භීතිකා රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ "ජලභීතිකා ආඥා පනතේ" 2 වෙනි වගන්තියේ ප්‍රකාර (333 වෙනි පරිච්ඡෙදය) "හිඟුරක්ගොඩ සුළු නගර සභා" සීමාව ඇතුළත පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක ගෙමිදුලක, නැතහොත් ගෙවත්තක නොවූ අන් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් එක්කරගෙන යනු නොලබන යම්කිසි ශුනකයෙකු (බල්ලෙකු) මා විසින් ලියවිල්ලකින් දෙනලද බලපත්‍රයක් ලත් අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. මෙම ප්‍රකාශණය 1966 අගෝස්තු මස 1 වෙනි දින සිට මාස හයක් වලංගු වන්නේ ය.

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1966. 7. 13 වෙනි දින,
හිඟුරක්ගොඩ සුළු නගරසභා කායර්‍යාලයේදීය.

7-1312—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## උඩුබද්දව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත—201 වන පරිච්ඡෙදය

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1966 වර්ෂය සඳහා මස්කඩයක් පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත්කිරීමට උඩුබද්දව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වනුයේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පතේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත දැන්විය යුතු බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 201 වන පරිච්ඡෙදයේ අංක 7 දරණ 1947 අංක 44 වැනි ආඥා පනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| යූ. අබ්දුල් වහාබ්, දිවරුම්පොල, දුම්මලසූරිය | හරක් මස් සහ එළු මස් | තල්ගම්මන වත්ත, උඩුබද්දව, ඉහල ගම |

ජේ. එච්. විකිරිබණ්ඩා,
උඩුබද්දව ගම්සභාවේ සභාපති.

1966ක්වූ ජූනි මස 22 වන දින,
උඩුබද්දව ගම්සභා කායර්‍යාලයේදීය.

7-1322—66.7.22 දින අංක 14,705 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය
### 1966

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| මාර්තු | ... | 66. 3. 4 | සිකුරාද | ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 3.11 | සිකුරාද | ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 3.18 | සිකුරාද | ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 3.25 | සිකුරාද | ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් | ... | 66. 4. 1 | සිකුරාද | ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 4. 7 | බ්‍රහස්පතින්ද | ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66. 4.15 | සිකුරාද | ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 4.22 | සිකුරාද | ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 4.29 | සිකුරාද | ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි | ... | 66. 5. 6 | සිකුරාද | ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | | 66. 5.13 | සිකුරාද | ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 5.20 | සිකුරාද | ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 5.27 | සිකුරාද | ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි | ... | 66. 6. 3 | සිකුරාද | ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | | 66. 6.16 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66. 6.24 | සිකුරාද | ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි | ... | 66. 7. 1 | සිකුරාද | ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | | 66. 7. 8 | සිකුරාද | ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | | 66. 7.15 | සිකුරාද | ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | | 66. 7.22 | සිකුරාද | ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66. 7.29 | සිකුරාද | ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි